Amãna Bank

## නිවාස මූල්‍ය පහසුකම්

ඔබටත් ඔබේ පවුලටත් තමාගේම නිවසක ඇති වටිනාකම අපි හඳුනමු. ඔබේ ප්‍රාර්ථනාව මල්ඵල ගැන්වීමට අපි වෙහෙසෙන්නේ එබැවිනි. ඔබේ නිවස මිලදී ගැනීමට/ ඉදිකිරීමට අප සහකරුවකු ලෙස ක්‍රියා කරන අතර එම කාලය තුළ අපේ දායකත්වය නැවත ගෙවීමෙන් නිවසේ අයිතිය ලබාගැනිමට ඔබට ඉඩ සලසන්නෙමු. නිවසේ අපේ දාකත්වයට අදාල කොටස අපි ඔබට කුලියට ලබාදෙන බැවින් එය සම්පූර්ණයෙන් භාවිතා කිරීමට ඔබට හැකිවනු ඇත.

ඔබේම නිවසක සිහිනය දැන් සැබෑ කරගන්න.

**අපට උපකාර විය හැකි අවශ්‍යතා**

- ඉඩමක් මිලදී ගැනීම
- සාදා නිමකළ නිවසක් මිලදී ගැනීම
- පවත්නා ඉඩමක නිවසක් ඉදිකරවා ගැනීම
- ඉඩමක් මිලදී ගෙන එහි නිවසක් ඉදිකරවා ගැනීම
- නිවස අලුත්වැඩියාව, විශාල කිරීම, නැවත සැකසීම හෝ වැඩිදියුණු කිරීම
- ලබා ගත් නිවාස මූල්‍ය පහසුකමක් පවරා දීම

**ස්වභාවය සහ ප්‍රතිලාභ**

- සංකල්පය: Diminsihing Musharaka
- තරගකාරී වාරික
- ඉදිකිරීම් හා විශාල කිරීමේ පහසුකම් සඳහා වසරක අනුග්‍රාහක කාල සීමාවක් ලැබෙනු ඇති.
- වත්කමෙහි බල විකිණුම් අගයෙන් 75%ක් දක්වා මූල්‍ය පහසුකම් ලබාගත හැක.
    - ඉඩම පමණක් මිලදී ගන්නේ නම් බල විකිණුම් අගයෙන් 60% ක් පමණක් ද ඉදිකිරීම් සඳහා භාණ්ඩ ලැයිස්තු අගයෙන් 75%ක් ද සියළුම ගණුදෙනුකරුවන්ට ලබාගත හැක.
    - වැටුප් ලබන සේවකයන්ට සහ වෘත්තිකයන්ට (වෛද්‍යවරු, ඉංජිනේරුවන්) නිවසක් සමඟ ඉඩමක් මිලදී ගන්නේ නම් (අවදනම් මට්ටමට යටත්ව) බල විකිණුම් අගයෙන් 75%ක් ලබාගත හැක.
    - ස්වයං රැකියා නියුක්තිකයන්ට හා විදේශ වල සේවය කරන නේවාසික නොවන ශ්‍රී ලාංකිකයින්ට නිවසක් සමඟ ඉඩමක් මිලදී ගන්නේ නම් (අවදනම් මට්ටමට යටත්ව) බල විකිණුම් අගයෙන් 65%ක් ලබාගත හැක.

- වසර 7ක් දක්වා වූ මූල්‍ය කාල සීමා
    - ව්‍යාපාර ආදායම් අයදුම්කරුවන් - වසර 7ක් දක්වා
    - අනේවාසික ශ්‍රී ලාංකික අයදුම්කරුවන් - වසර 5ක් දක්වා
    - වැටුප් ආදායම් අයදුම්කරුවන් - වසර 7ක් දක්වා

- පහසුකම සපයනු ලබන අවම මුදල් අගය : රු. 500,000/-
- පහසුකම සපයනු ලබන වැඩිම මුදල් අගය : රු. 20,000,000/-

**අවශ්‍ය ලියකියවිලි**

- ජාතික හැඳුනුම්පත (NIC)/විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය (DL)
- ආදායම් පිළිබඳ විස්තර හා සාක්ෂි
    - රැකියාවක නියුතු අයෙකු නම් :
        - පසුගිය මාස 03හි වැටුප් ප්‍රකාශන

- බඳවාගැනීමේ ලිපියෙහි පිටපතක්
- සේවා ලිපිය
- පසුගිය මාස 06හි බැංකු ප්‍රකාශන
- විදේශ රැකියාවක නියුතු නම්, එහි ගිවිසුම් ලිපිය
- අනිකුත් ආදායම් පිළිබඳ විස්තර

○ ව්‍යාපාරයක් නම් :
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකය
- පසුගිය මාස 06හි බැංකු ප්‍රකාශන
- විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශන (පසුගිය වසර 03)
- ව්‍යාපාරයට අදාල වත්කම් පිළිබඳ ලියකියවිලි
- අනිකුත් ආදායම් පිළිබඳ විස්තර

■ වත්කම් වලට අදාල ලියකියවිලි

○ අවසාන හිමිකම් ඔප්පුව (පිටපතක්)
○ මිනුම් පිඹුර -වසර 10ක් තුළ (පිටපතක්)
○ අනුමත කළ ගොඩනැගිලි සැළැස්ම (පිටපතක්)
○ සහතික කළ පත්‍රිරූ (වසර 30ක)
○ හිමිකම් සහතිකය (මාස 6ක් තුළ)
○ වීදි රේඛා සහතිකය (මාස 6ක් තුළ)
○ පවරා නොගැනීමේ සහතිකය
○ අනුකූලතා සහතිකය
○ බදු රිසිට්පත්
○ තක්සේරු දැන්වීම
○ ඉදිකිරීමක් නම්,
- අනුමත කළ ගොඩනැගිලි සැළැස්ම
- ඉදිරිකිරීම් භාණ්ඩ ලැයිස්තුව

## අදහස් සහ පැමිණිලි

අමානා බැංකුව, පාරිභෝගික ඔබගේ අදහස් සහ යෝජනා අගය කොට සලකයි. එබැවින් ඔබගේ අදහස්, ශාඛාවේ ඇති "**ඔබ ලද සේවා අත්දැකීම පිළිබඳව අපට කියන්න**" පෝරමය පිරවීමෙන් හෝ එම පෝරමය අප වෙබ් අඩවියෙන් බාගත කොට පිරවීමෙන් අප වෙත යොමු කරන්න.
මීට අමතරව, අප සේවාව පිළිබඳ ඔබගේ අදහස් සහ පැමිණිලි ඔබට පහත ආකාරයන්ගෙන් අප වෙත යොමු කළ හැක.

- අදාළ ශාඛාවේ කළමණාකාර මහතා හමුවීමෙන්
- ඔබගේ පැමිණිලි feedback@amana.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කිරීමෙන්
- අපගේ ක්ෂණික ඇමතුම් අංක 011 7 756756 ඔස්සේ අප ඇමතීමෙන්
- අපගේ වෙබ් අඩවියේ ඇති, සම්බන්ධ වන්න පිටුවෙහි ඔබගේ පැමිණිලි සටහන් කිරීමෙන්

ඔබගේ පැමිණිල්ල ලද විගස එය ලැබූ බවට සනාථ කරමින්, ඒ පිළිබඳව ඉදිරියේදී ගනු ලබන පියවරයන් සම්බන්ධයෙන් අප ඔබව දැනුවත් කර සිටිමු.